## පළමුවන කියැවීම

එසෙකියෙල් 2:2-5

එසෙකියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**"ඔවුන් කැරලිකාරයන් වුවත් දේව පණිවුඩය දැනගන්නෝ ම ය."**

උන් වහන්සේ මට කතා කළ විට, දේවාත්මානුභාවය මා තුළට ඇතුල් වී මා නැගිටුවා සිටෙව්වේ ය. මට කතා කළ තැනන් වහන්සේගේ හඬ මට ඇසුණේ ය. උන් වහන්සේ මෙසේ වදාළ සේක. "මනුෂ්‍ය පුත්‍රය, මට විරුද්ධව කැරලි ගැසූ, කැරලිකාර ජාතියක් වන ඉශ්රායෙල්වරුන් වෙත මම නුඹ යවමි. ඔව්හු ද ඔවුන්ගේ පියවරු ද අද දවස දක්වා මට විරුද්ධව ද්‍රෝහිකම් කළහ. ඒ සෙනග මුරන්ඩු දැඩි සිත් ඇත්තෝ වෙති. මම ඔවුන් වෙත නුඹ යවමි. නුඹ ද, "මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේකැ"යි ඔවුන්ට කියන්න. ඔවුන් කැරලිකාර මනුෂ්‍යයන් වන බැවින් සවන් දුන්නත්, නුදුන්නත් ඔවුන් අතරෙහි දිවැස්වරයෙකු සිටින බව ඔවුන් දැනගනු ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 123:1-4

පිළිතුර: සමිඳුනි, ඔබ දෙස අපගේ දෙනෙත් ඔසවමු.

ගීය: සග ලොව වැඩ වසන සමිඳුනි, ඔබ දෙස මාගේ ඇස් ඔසවමි. බලව දාසයකුගේ ඇස් සිය ස්වාමියාගේ අත දෙසත්, දාසියකගේ ඇස් සිය ස්වාමිදුවගේ අත දෙසත්, යොමු වී තිබෙන්නාක් මෙන්, අපේ දෙවිඳාණන්ගේ කරුණාව අප වෙත පහළ වන තෙක් අපේ දෑස එතුමාණන් දෙස යොමා තිබේ.

සමිඳුනි, අපට කරුණා කළ මැනව. අපට කරුණා කළ මැනව. මන්ද, අපි අධික ලෙස නින්දාවට ලක් වී සිටියෙමු.

සුව පහසු ලබමින් සිටින අයගේ උපහාසයටත් අහංකාරින්ගේ නින්දාවටත් අපි බොහෝ කල් ලක් වී සිටියෙමු.

## දෙවන කියැවීම

2 කොරින්ති 12:7-10

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**" ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි."**

ඒ එළිදරව් කිරීම්වල අති උතුම්කම කරණකොටගෙන, මා හිස උදුම්මා නොගන්නා පිණිස, මට පහර දීමට සාතන්ගේ දූතයෙකු වැනි, ශරීරයේ කා වැදුණු කටුවක් හා සමාන පීඩාවක් මට දෙන ලද්දේ ය. එසේ වූයේ මා හිස උදුම්මා නොගන්නා පිණිස ය. එය ඉවත් කරන මෙන් තුන් වරක් මම ස්වාමින් වහන්සේගෙන් ඉල්ලුවෙමි. උන් වහන්සේ පිළිතුරු දෙමින්, "මාගේ බලය පරිපූර්ණ වන්නේ දුර්වලකමේ දී බැවින්,

මාගේ වරප්‍රසාදය ඔබට සෑහේ ය"යි වදාළ සේක. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටු කරන්නෙමි. එහෙයින් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා පැමිණෙන දුර්වලකම් ද, අන්තරා ද, අගහිඟකම් ද, පීඩා ද, විපත්ති ද, මම සතුටින් පිළිගනිමි. තුමක් නිසාදයත් දුර්වලව සිටිය දී ම මම ශක්තිසම්පන්න ව සිටිමි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ජුවාම් 1:14,12

ආලේලූයා! ආලේලූයා!
ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක.
උන්වහන්සේ අදහාගත් අයට, දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස
උපත ලැබීමේ වරම උන්වහන්සේ දෙවා වදාළ සේක.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 6:1-4

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"දිවැසිවරයෙකුට ගරු බුහුමන් නැත්තේ සිය ගමේ දී පමණ ය."**

ජේසුස් වහන්සේ එතැනින් නික්ම සිය රටට පැමිණි සේක. ශ්‍රාවකයෝ ද උන් වහන්සේ පිරිවරා ගියහ. එය සබත් දින වූයෙන් උන් වහන්සේ ධර්මශාලාවෙහි උගන්වන්න පටන්ගත් සේක. උන් වහන්සේට සවන් දුන් සමූහයා විස්මිත ව, "මොහුට මේ දේවල් පහළ වූයේ කොහෙන් ද? මොහුට දී තිබෙන මේ ප්‍රඥාව කිමෙක් ද? මොහු අතින් කරනු ලබන හාස්කම් කවරේ ද? මොහු වඩුවා නොවේ ද? මරියාගේ පුතා නොවේ ද? ජාකොබ්, ජෝසෙප්, ජූදස් හා සීමොන් යන අයගේ සහෝදරයා නොවේ ද? මොහුගේ සහෝදරියනුත් අප අතර සිටිනවා නොවේ ද?" කියා ඔව්හු උන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. ජේසුස් වහන්සේ කතා කරමින්, "දිවැසිවරයෙකුට ගරු බුහුමන් නැත්තේ සිය ගමේ දීත්, නෑදැයන් අතර දීත්, තම ගෙදර දීත් පමණකැ" යි වදාළ සේක. එහිදී රෝගීන් ස්වල්ප දෙනෙකු පිට අත් තබා සුව කිරීම හැර, අන් කිසි හාස්කමක් කරන්න උන්වහන්සේට නොහැකි විය. ඔවුන්ගේ අවිශ්වාසය ගැන උන් වහන්සේ මවිත වූ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.